ජන මතය හැසිරවීමෙහි ලා ජනමාධ්‍ය අත ඇති බලය සැබවින්ම සුළු කොට තැකිය හැකි නොවේ. නිරවද්‍යතාවය ඇතුළු මාධ්‍ය ආචාර ධර්මයන් හා සංසක්ත වන මෙන් මාධ්‍යයන් නිරන්තරයෙන්ම දිරිමත් කිරීමටද එය එක් හේතුවකි. කෙසේ වෙතත් සෑම මාධ්‍යයක්ම මෙම බලය යහපත සඳහාම භාවිතා නොකිරීමද කණගාටුවට කාරණාවකි.

මව්බිම පුවත්පත ඔස්සේ දින දෙකක් තුළදී ඉදිරිපත් වූ පුවත් වාර්තාවන් දෙකකි. මෙයින් එකක් හිජාස් හිස්බුල්ලා සම්බන්ධ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව වන අතර, අනෙක කරන්නාගොඩගේ නඩු විභාගය අත්හිටුවීම පිළිබඳව වේ.

මෙහිදී අපගේ නිරීක්ෂණයට ලක් වූයේ, හිජාස් හිස්බුල්ලා වෙත එල්ල වී ඇති චෝදනා සම්බන්ධයෙන් ඔහු වරදකරුවෙකු බව දැනටමත් හැඟවෙන ආකාරයෙන්, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගේ ප්‍රකාශයන් උපුටා දැක්වෙමින් එක් පුවත් වාර්තාවක් ඉදිරිපත් වී ඇති බවයි. අනෙක් අතට, අනෙක් පුවත් වාර්තාවේ කරන්නාගොඩ වෙත ඉදිරිපත්ව ඇත්තේ චෝදනා බව, ඒවා චෝදනා මිස තවමත් සනාථ වූ කරුණු නොවන බව පෙන්වා දෙන ලෙසින් කරුණු පෙළගැස්වී තිබෙයි.

අධිකරණය ඉදිරියේ යම් කිසිවෙකු වරදකරුවෙකු ලෙසින් සනාථ වන තුරු, සැකකරුවෙකු වරදකරුවෙකු ලෙසින් චිත්‍රණය නොකිරීම වඩාත් සමබර, නිරවද්‍ය මාධ්‍යකරණය නොවේද? එසේ නම්, එය සෑම පුවත් වාර්තාවක් සමගින්ම සාධාරණ ලෙසින් දක්නට නොලැබෙන්නේ මන්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima